**ඇල්පිටිය ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**--------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 09 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ඔක්තෝබර් 25 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**----------------------**

ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේ දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබුණු රු.15,870,458 ක ණය මුදල මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ණයහිමි ශේෂය ලෙස, ගිණුම් පිළියෙල කල දිනය දක්වා වූ ඉකුත් වර්ෂයේ ණයහිමියන්ට කර තිබුණු රු.530,670 ක ගෙවීම් වල එකතුව පමණක් සාවද්‍ය ලෙස ගිණුම් වල දක්වා තිබුණි.

(ඇ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.7,479,894 ක දායක මුදල ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ඉටුකිරීම වෙනුවෙන් ලැබිය යුතු මුදල රු.163,000,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඉ) 2015 දෙසැම්බර් 31 දිනට සේවකයින් 10 දෙනෙකුගේ වැටුප් රහිත නිවාඩු දින 296 ක් වෙනුවෙන් අයවියයුතු රු.290,400 ක මුදල ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

## 1.3.3 නොසැසඳු පාලන ගිණුම්

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 07 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.3,610,186 ක් වූ අසමානතා විය.

## 1.3.4 ලැබිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු ගිණුම් ශේෂ වල එකතුව රු.23,535,622 ක් වූ අතර, ඉන් රු.19,468,148 ක ශේෂයක් 2012 වර්ෂයටත් පෙර සිට පැවතුණු නමුත්, එම ශේෂ නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

## 1.3.5 ගෙවිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවැති රු.3,199,601 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂ හා රු.801,455 ක් වූ පොදු සැපයුම් ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

එකතුව රු.3,472,822 ක් වූ තැන්පතු සහ රු.280,156 ක් වූ ලැබිය යුතු දේපල ණය පොලී සම්බන්ධයෙන් උපලේඛනද, රු.684,000 ක් වූ ඉඩම් සඳහා වන්දි ගෙවීමට ඇති ආයෝජන සඳහා උපලේඛන හා තැන්පතු සහතිකද, රු.18,116,095 ක් වූ දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගත් ණය වලට අදාළ ගිවිසුම් යනාදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී එම ගනුදෙනු සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 1.3.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

පහත විස්තර දැක්වෙන නීති, රීති, සහ රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
| --- | --- |
| **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 570 හා 571(1)(2) | 2015 දෙසැම්බර් 31 දිනට කල් ඉකුත් වූ එකතුව රු.212,875 ක තැන්පතු ශේෂ 05 ක් පැවතිය ද, ඒ සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1645 හා 1646 | සභාවට අයත් වාහන 18 ක් වෙනුවෙන් දෛනික ධාවන සටහන්පත් හා මාසික කාර්ය සාධන සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.21,428,007 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.8,257,216 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.13,170,791 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායමින් සියයට 71 ක් තරම් පුනරාවර්තන වියදම් පැවතීම නිසා පුනරාවර්තන ආදායමට සාපේක්ෂව පුනරාවර්තන වියදම් ඉහළ මට්ටමක පැවතින.

(ආ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ දෙක තුළ සභාවේ ආදායම් ආධාර, ස්වයං උත්පාදන ආදයම් සහ පුනරාවර්තන වියදම් තොරතුරු පහත දැක්වේ

| වර්ෂය | මුළු පුනරාවර්තන ආදායම් | ආදායම් ස්වයං ආධාර මුදල් | මුළු උත්පාදන ආදායම් | ස්වයං පුනරාවර්තන වියදම් | උත්පාදන ආදායම් ඉක්මවා ගිය පුනරාවර්තන වියදම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 73,874,936 | 40,194,082 | 33,680,854 | 52,446,928 | 18,766,074 |
| 2014 | 53,871,510 | 31,406,984 | 22,464,526 | 45,614,293 | 23,149,767 |
| 2013 | 43,823,012 | 21,120,853 | 22,702,159 | 37,816,525 | 15,114,366 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සභාවේ පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් සැලකිය යුතු අගයන්ගෙන් වැඩි වී තිබුණු නමුත්, එම තත්ත්වයන් හඳුනාගෙන වියදම් පාලනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ සභාවේ ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණය ඉක්මවා රු.18,766,074 ක මුළු පුනරාවර්තන වියදම් පැවැතුණි.

(iii) ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් කිසිදු ආකාරයකින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට හැකියාවක් නොලැබෙන බව පෙන්නුම් කෙරුණි.

(ඇ) වැඩසටහන් අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම් හා වියදම් සසඳා බැලීමේ දී වැඩසටහන් හතරකම ආදායම් ඉක්ම වූ වියදම් දක්නට ලැබුණි.

(ඈ) ප්‍රාග්ධන ආදායම ඉක්මවා රු.12,551,784 ක ප්‍රාග්ධන වියදම් දරා තිබූ නමුත්, සභාවේ ස්වයං උත්පාදන ආදායමින් සියයට 30 ක් වත් ප්‍රාග්ධන වියදම් ලෙස ඇස්තමේන්තුගත කර නොතිබුණි.

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

කර්මාන්ත ඉටුකිරීම වෙනුවෙන් ලැබීමට ඇති මුදල් රු.163,000,000 ක් වැඩියෙන් ගිණුම් ගතවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් සියයට 74 කින් වැඩි වී තිබූ අතර, එය සභාවේ කාරක ප්‍රාග්ධනය වැඩිවීම කෙරෙහි ද සෘජුව බලපා තිබුණි.

## 2.4 ආදායම් පරිපාලනය

---------------------

### 2.4.1 වරිපනම් බදු

-------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.9,162,732 ක් වී තිබුණ නමුත්, හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

### 2.4.2 අක්කර බදු

------------

සමාලෝචිත වර්ෂයේ පැවැති රු.376,687 ක් වූ හිඟ අක්කර බදු ශේෂයෙන් වර්ෂය තුළ අයකර තිබුණේ රු.50,941 ක අගයක් පමණි. හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.4.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,175,650 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.11,388,824 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මෛත්‍රීගම පොදු සුසාන භූමියේ නව ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා පළාත් සභාව විසින් 2015 වර්ෂයේ රු.5,000,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද, 2016 ජූලි 31 දින වනවිටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

(ආ) සේවක සංඛ්‍යා සැලැස්ම අනුව අනුමත තනතුරු 02 ක පැවැති පුරප්පාඩු 05 ක් සම්පූර්ණ කර ගැනීම හෝ බඳවාගෙන තිබුණු 04 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

2010 මාර්තු 17 දින දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගත් ණය නියමිත පරිදි නොගෙවීම නිසා ණය මුදල ප්‍රතිව්‍යුහ ගතකිරීමෙන් උද්ගත වූ රු.233,775 ක පොලියක් ගෙවීමට එකඟ වී තිබුණි.

**3.3 අවිධිමත් ගනුදෙනු**

---------------------

අ) පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ හා පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් හෝ නිර්දේශ මෙන්ම විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන 2015 ජූලි 08 දින රු.100,000 ක මුදලක් ප්‍රාදේශීය සභාවේ පළාත් පාලන සේවා සුභසාධන සමිතියට ලබා දී තිබුණද, ඊට අදාළ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) හා (ඕ) වගන්ති වලට අනුකූල නොවී, අවස්ථා 08 කදී එකතුව රු.818,500 ක වියදම්ද, අවස්ථා 03 කදී සභා අරමුදලින් එකතුව රු.147,180 ක උත්සව වියදම්ද දරා තිබුණි.

ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතට නොගැනෙන විදේශ අධ්‍යයන චාරිකාවන් හතක් සඳහා සභාපති ඇතුළු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු 06 දෙනෙකුට නවාතැන් හා ආහාර සඳහා සභා අරමුදලින් වියදම් දරා තිබිය දීත්, ඒ ගැන නොසලකා රු.1,304,490 ක් යැපීම් දීමනා ගෙවා තිබුණි. මන්ත්‍රීවරුන් තුන් දෙනෙකු විසින් විදේශගතවීම සඳහා විධිමත් පරිදි රාජකාරි නිවාඩු අනුමත කරගෙනද නොතිබුණි

**3.4 හඳුනාගත් අලාභ**

------------------

අංක PF-7406 දරන කැබ් රථයට 2015 ජූලි 30 දින සිදු වූ අනතුර සම්බන්ධයෙන් කරන ලද මූලික පරීක්ෂණ වාර්තාවේ නිර්දේශය අනුව අදාළ අනතුර මීට පෙර සිදු වී ඇති එකක් බව තහවුරු කර තිබුණි. එම හේතුව නිසා අනතුර සම්බන්ධ හිමිකම් ගෙවීම් රක්ෂණ ආයතනය විසින් ප්‍රතික්ෂේප කර තිබුණු නමුත්, පරීක්ෂණයක් පවත්වා සිදු වූ අලාභය තක්සේරුකර වගකිවයුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

.

**3.5 ව්‍යාපෘති ප්‍රමාද කිරීම**

----------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බලප්‍රදේශය තුළ ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබූ රු.405,000 ක මුදලක් අදාළ ව්‍යාපෘති සඳහා භාවිතා නොකර, නිෂ්ක්‍රීයව රඳවා තිබුණි.

(ආ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ කහඳුව අරලියවත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.500,000 ක මුදලක් අනුමත වී තිබූ නමුත්, 2016 ජූනි 20 දින වන විටත් එම කර්මාන්තය ආරම්භ කර නොතිබුණි.

**3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

සභාව තුළ ක්‍රියාත්මක වන පිළිසරු ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් ලැබී තිබුණු රු.1,252,311 ක මුදලින් රුපියල් ලක්ෂ 10 ක් වැයකර 2010 වර්ෂයේදී කසල වෙන් කිරීමේ කටයුතු සඳහා ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණද, 2016 ජූනි 23 දින වන විටද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

### 4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයක රු.800,100 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයද, වියදම් විෂයයන් 05 ක එකතුව රු.11,625,904 ක ඉතිරිවීම්ද, තවත් වියදම් විෂයයක සීමාව ඉක්මවා රු.19,502 ක වියදම්ද, ආදායම් විෂයයන් 05 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් රු.3,687,295 ක්ද, පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.3 වත්කම් කළමනාකරණය

----------------------------

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

සභා භූමියේ දිරාපත් වෙමින් පවතින වාහන පහක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට යොදවා ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

-------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඇ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) වාහන පාලනය